# පරිගණකයට නිවැරදි සිංහල අකුරු කැවූ පුෂ්පා අකුරු හොරුන්ට එරෙහිව නැගී සිටියි



පුෂ්පානන්ද ඒකනායක

ස්ථානය - කොළඹ, නාරාහේන්පිට පොලිසිය
දිනය - මීට වසර පහකට පෙර එක්තරා දිනයක්

කොළඹ අපරාධ අංශයට පැමිණිල්ලක් කිරීමට තම නීතිඥයා ද සමඟ පැමිණි පුද්ගලයෙක් සාජන්ට්වරයකු ඉදිරියේ ඉඳගෙන සිටී. පැමිණිල්ල ලියා ගන්නට සූදානම් වූ සාජන්ට්වරයා පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීමට පටන් ගත්තේය.

"මොකක් සම්බන්ධව ද පැමිණිල්ල?"

"හොරකමක් සම්බන්ධව"

"මොනවද හොරකම් කරල තියෙන්නෙ?"

"අකුරු"

සාජන්ට්වරයාගේ ඇස් දොඹගෙඩි තරම් විශාල විය.

"අකුරු... අකුරු..."


සාජන්ට්වරයාට මෙය විශ්වාස කරගත නොහැකි විය.

"අකුරු හොරකම් කරලා? කොහොමද අකුරු හොරකම් කරන්නෙ?"

"මම කොම්පියුටරයෙන් අකුරු අඳිනවා. ඒවා හොරකම් කරලා, හොරෙන් පාවිච්චි කරලා."

සාජන්ට්වරයාට ඔහු කියන දේ වටහා ගත නොහැකිය. ඔහුගේ ජීවිත කාලයටම මෙවැනි හොරකමක් ගැන අසා තිබුණේ නැත.

"කොහොමද අකුරු හොරකම් කෙරුවා, හොරෙන් පාවිච්චි කෙරුවා කියන්නේ?" ඔහු යළිත් ඇසුවේය.



පැමිණිලිකරු තමා රැගෙන ආ පුවත්පත් කිහිපයක් මේසය මත දිග හැර තබා විස්තර කරන්නට විය.

"මේ තියෙන්නෙ මගෙ අකුරු, මම ඇඳපුවා. මේවා මගෙ අවසරයක් නැතුව හොරෙන් පාවිච්චි කරලා..." සාජන්ට්වරයා අන්දුන් කුන්දුන් විය.

"කොහොම ද මේ අකුරු ඔහෙගෙ කියන්නෙ? ඔය පත්තරවල ඕන තරම් අකුරු තියෙන්නෙ. තව කෙනෙක් වුණත් ඇවිත් කියයි මේ එයාගෙ අකුරු කියලා. කොහොම ද මේ අකුරු ඔයාගෙ කියලා ඔප්පු කරන්නෙ?"

පැමිණිලිකරු යළිත් සාජන්ට්වරයාට පැහැදිලි කරන්නට පටන් ගත්තේය.

"මම පරිගණකයෙන් නිර්මාණය කරපු අකුරු වෙනම ම අඳුන ගන්න පුළුවන්. මේ තියෙන්නෙ මගෙ අකුරු, මේව අනිත් සාමාන්‍ය අකුරු. මගෙ අකුරුවල නැවෙන තැන් හැඩ වෙලා තියෙන තැන් මම දන්නවා"

පරිගණක ක්‍රියාකාරීත්වය පිළිබඳව අවබෝධයක් නොතිබූ සාජන්ට්වරයාට, තම බුද්ධිමය දේපළ අයිතිය සනාථ කිරීම සඳහා සෑහෙන වෙහෙසක් දරන්නට පැමිණිලිකරුට සිදු විය. පැමිණිලිකරු තමා අකුරු නිර්මාණය කළ ආකාරයේ සිට තමාට ඒවායේ ඇති නීතිමය අයිතිය දක්වා මහත් වෙහෙසක් දරා පැහැදිලි කිරීමෙන් අනතුරුව පැමිණිල්ල ලියා ගැනීමට සාජන්ට්වරයා එකඟ විය.

එහෙත් ඔහුට හෝ අනිකුත් නිලධාරීන්ට මේ පැමිණිල්ල පිළිබඳව පැහැදිලි අවබෝධයක් හෝ අදහසක් තිබුණේ නැත. ශ්‍රී පොලිස් ඉතිහාසයේ කිසිදාක එවැනි පැමිණිල්ලක් පොලිස් පොතක සටහන් වී නොතිබීම එයට හේතුවයි.

එබැවින් එය ඓතිහාසික පැමිණිල්ලකි. බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ අලුත් වංශ කතාවක් එම පැමිණිල්ලත් සමඟ ම ආරම්භ විය.

මේ ඓතිහාසික පැමිණිලිකරුගෙ නම සෙනරත් පතිරගේ පුෂ්පානන්ද ඒකනායකය.

ශ්‍රී ලංකාවේ පළමු වරට පරිගණකය සඳහා නිවැරදි සිංහල ක්‍රමයට, සිංහල අකුරු පද්ධතියක් නිර්මාණය කරන ලද්දේ ඔහු විසිනි.

"ද ෆොන්ට් මාස්ටර්" අකුරු යන නමින් අද පරිගණක ලෝකයට එකතු වී ඇත්තේ එම අකුරු පද්ධතියයි.

පරිගණකය ශ්‍රී ලංකාවට පැමිණීමත් සමඟ ම පරිගණකයට අවශ්‍ය සිංහල අකුරු නිර්මාණය කිරීමේ අවශ්‍යතාව ද පැන නැඟිණි. පැරණි අච්චු අකුරු අමුණා ඒවායෙන් සැකසූ පිටපත් කැමරාවට ගෙන පොසිටිව් සකස් කර, ඒ මඟින් ඔෆ්සෙට් මුද්‍රණයට අවශ්‍ය 'ප්ලේට්' සාදා ගැනීම මුල් කාලයේ දී සිදු වූ ක්‍රමයයි.

පරිගණකය සඳහා සිංහල අකුරු නිර්මාණය කිරීමක් පිළිබඳව මුල්වරට ක්‍රියාත්මක වූ පුද්ගලයා උපාලි සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘ උපාලි විජේවර්ධනයි. ඔහු 1981 දී ආරම්භ කළ 'දිවයින' ඉරිදා සංග්‍රහය සඳහා අලුතින්ම සිංහල පරිගණක අකුරු නිර්මාණය කරවූයේය. එම අකුරු පද්ධතිය නිර්මාණය කරන ලද්දේ ගුණසිරි කොළඹගේ විසිනි.



ගුණසිරි කොළඹගේ

එතැන් පටන් දිගින් දිගටම විවිධ පුද්ගලයන් පරිගණකය සඳහා අකුරු නිර්මාණය කර ඇතත් ඒ කිසිම අකුරක් නිවැරදි හා සම්පූර්ණ සිංහල අකුරු නොවේ. පුෂ්පානන්ද විසින් නිර්මාණය කරන ලද 'ද ෆොන්ට් මාස්ටර්' අකුරු පද්ධතිය එළි දක්වන තුරුම නිවැරදි සිංහල පරිගණක අකුරු පද්ධතියක් තිබුණේ නැත.

පරිගණකය සඳහා සිංහල අකුරු නිර්මාණය කිරීමක් පිළිබඳව මුල්වරට ක්‍රියාත්මක වූ පුද්ගලයා උපාලි සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘ උපාලි විජේවර්ධනයි. ඔහු 1981 දී ආරම්භ කළ 'දිවයින' ඉරිදා සංග්‍රහය සඳහා අලුතින්ම සිංහල පරිගණක අකුරු නිර්මාණය කරවූයේය. එම අකුරු පද්ධතිය නිර්මාණය කරන ලද්දේ ගුණසිරි කොළඹගේ විසිනි. එතැන් පටන් දිගින් දිගටම විවිධ පුද්ගලයන් පරිගණකය සඳහා අකුරු නිර්මාණය කර ඇතත් ඒ කිසිම අකුරක් නිවැරදි හා සම්පූර්ණ සිංහල අකුරු නොවේ. පුෂ්පානන්ද විසින් නිර්මාණය කරන ලද 'ද ෆොන්ට් මාස්ටර්' අකුරු පද්ධතිය එළි දක්වන තුරුම නිවැරදි සිංහල පරිගණක අකුරු පද්ධතියක් තිබුණේ නැත.

පුෂ්පානන්දට නාරාහේන්පිට පොලිසියේත් ඉන් පසුව රහස් පොලිසියේත්, ඊටත් පසුව දැන්වීම් ඒජන්සිවලත් රස්තියාදු වන්නට සිදු වූයේ ඔහු විසින් නිර්මාණය කරන ලද ඇතැම් අකුරු මෝස්තර, එම දැන්වීම් ඒජන්තකරුවන් විසින් හොරෙන් පාවිච්චි කිරීම නිසාය. අවසානයේ ඔවුන්ට එරෙහිව නීති මඟින් කටයුතු කරන්නට දැන් ඔහු සමත් වී සිටී.

ඔහු නිර්මාණය කළ අකුරු සොරකම් කර තිබුණේ ඔහුගේ පරිගණකය අලුත්වැඩියාවකට ගෙන ගොස් තිබූ අවස්ථාවක දී ය. ඔහුට හොරකම අසු වූයේ දැන්වීම් ඒජන්සියක් මඟින් නිර්මාණය කරන ලද දැන්වීමක් පුවත්පතක පළ වී තිබිය දීය. එම දැන්වීම සඳහා ඔහුගේ අකුරු යොදා ගෙන තිබිණි.

ඔහුගේ අකුරු සොරෙන් ගන්නා අය නොදන්නා කාරණයක් තිබේ. එය නම් පුෂ්පානන්ද තමා නිර්මාණය කළ අකුරුවලට 'බුද්ධිමය දේමළ අයිතිය' පිළිබඳ පනත යටතේ 'පේටන්ට්' අයිතිය ලබා ගෙන ඇති බවයි.

එම නිසා මේ අකුරු හොරෙන් ගන්නට යාමේ තේරුමක් නැත. අවශ්‍ය අයෙකුට මුදල් ගෙවා තමන්ට අවශ්‍ය අකුරු මෝස්තර ඔහුගේ ෆොන්ට් මාස්ටර් ආයතනයෙන් මිලදී ගත හැකිය. නිවැරදි සිංහල අකුරු යොදා දර්ශණීය සිත් ගන්නා සුළු මුද්‍රණ කටයුතු කරන්නට කැමති ඕනෑම අයකුට පුෂ්පාගේ 'ද ෆොන්ට් මාස්ටර්' අකුරු ගැලපෙයි.

පුෂ්පානන්ද විසින් නිර්මාණය කරන ලද සිංහල අකුරු මෝස්තර 14කට අධික සංඛ්‍යාවක් මේ වන විට වෙළඳ පොළට හඳුන්වා දී තිබේ. මේවා දැන් බහුල ලෙස පොත් සහ පොත් කවර, කැසට් කවර, පෝස්ටර් සහ දැන්වීම් පත්‍රිකා ආදිය සඳහා යොදා ගනු දක්නට ලැබේ.



තවත් අකුරු මෝස්තර සමූහයක් සහ සිංහල සැරසිලි මෝස්තර රැසක් දැන් ඔහු අතින් නිම වෙමින් පවතී. ඔහුගේ අකුරුවල ඇති විශේෂම ලක්ෂණය නම් අනිකුත් පරිගණක අකුරු මෙන් විකෘති නොවී අකුරේ නියම ස්වරූපය තිබීමයි. මේ නිසා ඔහුගෙ අකුරුවල ඉස්පිලි, පාපිලි එහාට මෙහාට පනින්නේ නැත. 'ජ' යන්න 'ඡ' යන්න වරදින්නේ නැත. සිංහල හෝඩියේ ඇති සමානරූපී අකුරු ඒවායේ නියම ස්වභාවය අනුව වෙන් කර හඳුනා ගත හැකි අන්දමට එම අකුරු නිර්මාණය වී ඇත.

මේ නිසා නිවැරදි සිංහල අකුරු ලිවීම උගන්වන්නට නම් අධ්‍යාපන අමාත්‍යාංශය මේ අකුරු පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් බව කිව යුතුය.

පුෂ්පානන්ද ඒකනායක යනු කොළඹින් ඈත පිටිසර ඉපදී කොළඹ නගරයට පැමිණි තරුණයෙකි. මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ශිල්ප හදාරන අවධියේ සිටම ඔහුගේ සිත යොමු වී තිබුණේ කලාවටය. ඒ දිනවලත් ඔහු අලුත් අලුත් හැඩයේ අකුරු නිර්මාණය කළේය.

පාසල් අධ්‍යාපනයෙන් පසු 'ෆීනික්ස්' ප්‍රචාරක ආයතනයේ අක්ෂර නිර්මාණ ශිල්පියකු ලෙස කටයුතු කළ ඔහු ඉන් අනතුරුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අක්ෂර නිර්මාණ ශිල්පියකු ලෙස සේවය කළේය. රූපවාහිනියේ 'රූපවාහිනී පුවත්' යන සිරස්තලය මුලින්ම නිර්මාණය කරන ලද්දේ ඔහු විසිනි.

තම අකුරු වංචාසහගතව යොදා ගන්නා ඕනෑම අයකුට හෝ ආයතනයකට හෝ එරෙහිව නීතිය මඟින් කටයුතු කරන බව පුෂ්පානන්ද අප සමඟ පැවසීය. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් නීති ඇති නමුත් ඒවායෙන් ප්‍රයෝජන නොගන්නා බව කියන ඔහු වන්දි ලබා ගැනීමට වඩා මෙවැනි දේපළක වටිනාකම ආරක්ෂා කිරීමට පූර්වාදර්ශයක් සැපයීම සඳහා දුෂ්කරතා විඳගෙන හෝ අකුරු හොරුන්ට එරෙහිව කටයුතු කරන බව පුෂ්පානන්ද අවසාන වශයෙන් අප සමඟ කියා සිටියේය.

උපුල් අමරසිංහ